# අම්බලම් හා බැඳුනු ගැමි සමාජය පිළිබඳ අධ්‍යයනයක්

ජ.වී.පී නිලූකා කරුණාරත්න

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
nilukakarunarathna1994@gmail.com

ප්‍රමුඛ පදඃ අම්බලම, පැරණි ගම, ජන සන්නිවේදන,ගමනාගමන

**හැඳින්වීම**

අතීත ලාංකේය සමාජය තුළ ගම හා බැඳුණු විශේෂි වටිනාකමක් හිමි වූ ස්ථානයක් ලෙස අම්බලම ව්‍යවහාරයට එකතුවේ. වර්තමානයේ මෙන් ගමනාගමන කටයුතු සුලබ නොවූ අතීතයේ පොදු ජනතාවගේ ගමනාගමන කටයුතු මෙන් ම පොදු කටයුතුවල දී ද ජනතාවට සහය දීම සඳහා ගොඩනැගුනු ඒකකයක් ලෙස අම්බලම හැඳින්විය හැකිය. අතීතයේ සිට වර්තානය දක්වා වෙනස් වූ සමාජ රටාව තුළ වත්මන් අම්බලමට හිමි වී ඇති ස්ථානය සීමිත වන බව ද කිව යුතු ව ඇත. අතීත දුර බැහැර ගමන්බිමන, වන්දනාගමන්, රාජකීය කටයුතු ආදියෙහි නිරත වූ ඕනෑම කෙනෙකුට සෙවන සැලසූ අම්බලම වර්තමානය වන විට පුරාවිද්‍යා ස්මාරකයක් බවට පත්ව ඇති අතර ම ඉතා සීමිත ප්‍රමාණයක් මේ වනවිට ශේෂව තිබේ. වර්තමානයේ ඉතිරිව පවත්නා මේ සාධක ඇසුරු කර ගනිමින් අම්බලම් හා බැඳුනු ජන සමාජය පිළිබඳව තොරතුරු අධ්‍යනය කිරිම මෙහි දී සිදු කරනු ලැබේ.

එහි දී වෙනස් වූ සමාජ රටාව තුළ ග්‍රාමීය සමාජයේ අම්බලමට හිමි වූ ස්ථානය, එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ තව දුරටත් මෙමඟින් අධ්‍යයනය කරනු ලබන අතර අම්බලම් පිළබඳ සථාන අනුව තොරතුරු ගොනු කර තිබුන ද ඒවා හි ක්‍රියාකාරිත්වය පිළිබඳව තවදුරටත් අධ්‍යනය කරමින්,

- පැරණි ගම හා බැඳුණු අම්බලම්වල ක්‍රියාකාරිත්වය.
- අම්බලම් හා බැඳුණු ජන සන්නිවේදන රටාව හා ජන සංස්කෘතිය.
- ග්‍රාමීය ජනතාව මෙන්ම ආගන්තුකයන්ට ද මෙයින් ලද සේවය.
- සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් අම්බලම හා බැඳුණු ක්‍රියාකාරකම්

ආදිය පිළිබඳ තොරතුරු මේ පර්යේෂණය තුළින් සාකච්ඡා කර තිබේ.

**ක්‍රමවේදය**

මූලාශ්‍රය අධ්‍යයනය හා ක්ෂේත්‍ර ගවේෂණ යන අංශ යටතේ දත්ත එකතු කිරීම හා විශ්ලේෂණය සිදු කිරීම තුළින් මේ සඳහා ක්‍රමවේදය සකස්කර ගන්නා ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

නූතන යුගය මෙන් ගමනාගමන ප්‍රවාහන මාධ්‍යයන් නොවූ අතීතයේ මගීන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග අසල විශ්‍රාම ගැනීම සඳහා කරවන ලද කුඩා ගොඩනැගිල්ල අම්බලම ලෙස හඳුන්වනු ලැබේ. වර්තමානයේ ඉතුරුව ඇති සාධක අනුව බලන විට බොහෝ පැරණි ගමන් මාර්ග වැටී තිබුනේ වෙල්යායවල් අසලිනි. ඊට හේතුව වී ඇත්තේ වෙහෙසකර

ගමනක නිරතවන මගියාගේ විඩාව සන්සිඳවීම ජල අවශ්‍යතා ගමනාගමනයේ දී සහය වූ සතුන්ගේ ජලය ආහාර ආදිය ඉතා පහසුවෙන් වෙල්යාය අසලින් සම්පාදනය කළ හැකි වූ නිසාවෙන් විය හැකිය. බොජුන්හල් ආදිය නොවූ එකල නිවසින් රැගෙන එන බත්මුල ආහාරයට ගත් ගැමියන් අම්බලමේ දී විවේක ගෙන වෙහෙස නිවාගැනී ම වෙනුවෙන් කිසිදු මුදලක් අය නොකෙරුනි.

ග්‍රාමීය සමාජයේ වැදගත් ස්ථානයක් සේ පැවති අම්බලම නඩත්තු කටයුතු ගැමියන් හා ගමෙහි ප්‍රධානීන් විසින් ස්ව කැමැත්තෙන් ම සිදු කළ බව කිව යුතු ය. පදිකයන්ට සහන සැපයීම මෙන්ම විවිධ සමිති සභා ආදිය පැවැත්වී ම, බඳු එකතු කිරීම රටේ තොටේ තොරතුරු හුවමාරු කර ගැනීම ආදි සමාජීය ක්‍රියාකාරකම් ද මෙහි දී සිදුවිය. මේ නිසාම ආනන්ද කුමාරස්වාමි සිය මධ්‍යකාලීන සිංහල කලා නම් කෘතියෙහි අම්බලම් යන්න අර්ථ දක්වා ඇත්තේ 'මාවත පසෙක පිහිටි ආවරණ සහිත ස්ථානයක්' ලෙසය. සංස්කෘත ග්‍රන්ථ අනුව, 'විශ්‍රාමශාලා මඨසභා උත්කරණ ශාලා අම්බර' ලෙසට ද පාලි භාෂාවේ 'ශාලා, ඉසාබුහල්, මාවත් මඩු' ලෙසින් ද ඉංග්‍රිසි භාෂාවේTavellors Rest "Way side Inn "Way side sheltors වැනි යෙදුම්වලට අනුව අම්බලම් යන්න අර්ථ දක්වයි.

අතීත ජන සමාජය දෙස සුපරීක්ෂාකාරී ව බලන විට පැහිදිළිවන කරුණ වනුයේ අම්බලම යනු ගැමි ජනයා විසින් ම නිර්මාණය කර ගනු ලැබූවා වූ පොදු ස්ථානයක් බවය. මෙහි දී සාමාන්‍ය වැසියන් මෙන්ම සියලු තරාතිරම්වල සිටි වැසියන් මේ සඳහා අනුග්‍රහය ලබා දුන් අතර ඒ හරහා සමාජයේ ගරුත්වයක් ලබා ගැනීමට ද අවස්ථාව ලැබිය.තවද කිසිදු තරාතිරම් බේදයකින් තොරව රජුගේ සට ගිහි පැවිදි ධනවත් දුප්පත් සිගනුන් ආදි මේ සැම දෙනාට ම සෙවන සැපයීම අම්බලම හරහා සිදුවිය.

ආරම්භක අවධිය තුළ කුල බෙදීමකින් තොරව අම්බලම් පරිහරණය කිරීමේ හැකියාව පැවති බව කෑගල්ල මංගලගම,අලුත්නුවර ගිරුවා,රුකුලා වැනි අම්බලම් පිළිබඳ අධ්‍යනය කිරීමේ දී පැහැදිළි වේ. නමුත් මහනුවර යුගය වන විට මෙහි තත්ත්වය ක්‍රමයෙන් වෙනස් වූ බවට නාරම්වල,දවුලගල,ගොඩමුන්න ආදි අම්බලම් පිළිබඳව අධනයේ දී පැහැදිළි වේ. මෙහි දී සැළනිළිමත් විය යුතු සාධනය වනුයේ අම්බලම තුළ වාඩිවීමට තිබූ ආසනවල උසෙහි යම් වෙනසක් වූ බවය. ඒ අනුව විවිධ කුලවල අය මේවාහි වාඩි වූ බව උපකල්පනය කළ හැකි ය. මේ අනුව මහනුවර යුගය වන විට කුල ස්ථරායනය අනුව අම්බලම් ආසන තුළ යම් වෙනසක් වූ බව හැගෙන නමුත් පොදුවේ මෙම ගොඩනැගිල්ල භාවිත කිරීමේ හැකියාව තිබූ බව කිව යුතුය.

පැරණි සමාජය තුළ ආගමික කටයුතු සඳහා යොමු වූ ජනතාවට සහන සැපයූ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස අම්බලම් හැඳින්විය හැකිය. අතීතයේ පාගමනින් හෝ කරත්ත මඟින් සිදු වූ වන්දනා ගමන්වලදී එකී වන්දනාකරුවන්ට වෙහස නිවා ගැනීම, ආහාර ගැනීම සඳහා අම්බලම් වැදගත් වූ අතර ශ්‍රී පාදය, අනුරාධපුරය, පොළොන්නරුව, අලුත්නුවර දේවාලය ආදි ස්ථාන මුල් කර ගනිමින් අම්බලම් නිර්මාණය වී ඇති බව සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම පුරාවිද්‍යා සාධක අනුව ද තහවුරු වේ.

"නිශ්ශංකමල්ල රජු ශ්‍රී පාදය වන්දනා කිරීම සඳහා යන වන්දනාකරුවන් සඳහා අම්බලමක් කල බවත්"(පූජාවලිය,34-734)වන්දනාගමන් මෙන්ම කිරි ආහාර පූජා, දේවාල ආශ්‍රිත උත්සව ආදි කටයුතු වල නිරත වූ අයගේ පහසුව සඳහා ද අම්බලම් භාවිත වී ඇත.

අම්බලම් හා බැඳුණු ගැමි සමාජය පිළිබඳව තොරතුරු සාකච්ඡා කිරීමේ දී ඒ හා බැඳුණු ආර්ථික කටයුතු ද ඉතා වැදගත් වේ. වෙළඳ කටයුවල දී මෙය ඉතා ප්‍රයෝජනවත් වූ අතර තවලම් හරහා සිදු වූ අතීත වෙළඳාම් කටයුතුවල දී දුෂ්කර වූ ගමනාන්තවලට ළඟාවෙන වෙළඳුන්ට අම්බලම් මහෝපකාරී විය. තම බඩු බාහිරාදිය මෙහි තබා ගිමන් නිවූ වෙළඳුන් භාණ්ඩ හුවාරු මධ්‍යස්ථානයක් ලෙස මෙය භාවිත කරන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. තවද විවිධ ජාතීන්ට අයත් වෙළඳුන් අම්බලම් භාවිත කළ බවට සාධක ජන සාහිත්‍ය අධ්‍යයනයේ දී අනාවරණය වේ. රජයට අයිති බදු එකතු කළ ස්ථානයක් ලෙස ද මූලාශ්‍රයවල තොරතුරු සඳහන් වේ.

අම්බලම යනු, ගමේ සිටින අය මෙන්ම ගමට පිටතින් පැමිණෙ පිරිස ද පැමිණෙන ස්ථානය කි. මේ නිසාම රට තොට තොරතුරු විමසීම මෙහිදී සිදු වූ බව ඉතා පැහැදිළිය. රජයෙන් ලද අණ පනත් පණිවිඩ ආදිය ගැමියන්ට සමීප කළ හැකි ස්ථානයක් ලෙස අම්බලම හැඳින්විය හැකිය. රටතොට තොරතුරු විමසමින් මෙන්ම අල්ලාපසල්ලාපයේ යෙදමින් ගැමියන්ගේ වෙහෙසකර වූ දවසේ මහන්සිය නිවා ගැනීමට ද අම්බලම තෝතැන්න විය. තවද අම්බලම හා සමගාමීව අපූරු සාහිත්‍යයක් ගොඩ නැගුනු බවද කිව යුතුව ඇත. "
ඇල්ලේ උඩ දෙනියේ ඇලවෙල්ලේ පලයල්ලා", "ගොසින් ගොසින් අම්බලමේ ඉදපල්ලා "යනු එවැනි කවි වේ.

**සමාලෝචනය**

සමාජ පරිණාමය නිසාවෙන් වෙනස් වූ සමාජය තුළ වත්මන් අම්බලම පුරාවිද්‍යා ස්මාරකයක් බවට පරිවර්තනය වී ඇත.නමුත් පැරණි ගමනාගමන පද්ධතියේ වූ වෙහෙසකර ගමනාන්තවලට විසඳුමක් ලෙසින් පදිකයන්ගේ අවශ්‍යතා සැපිරීම සඳහා නිර්මාණය වූ ගොඩනැගිලි විශේෂයක් ලෙස අම්බලම හැඳින්විය හැකිය. කරුණක් වනුයේ අම්බලම් යනු , හුදෙක් මගීන් සඳහාම ඉදි වූ ගොඩනැගිල්ලක් නොව එය තුළ ඉහත සඳහන් ආකාරයට ඉන් එහා ගිය සමකාලීන සමාජයට අත්‍යවශ්‍ය අංගයක් වූ හා නිරන්තර පරිශීලනය කල සමාජ ආර්ථික ආගමික සංස්කෘතික හා දේශපාලනික ක්‍රියාවලින්ගේ එකතුවෙන් නිර්මාණය වූ තැනක් බව පෙන්වාදිය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


විදානපතිරණ,වී. (2017)*මාර්ග පුරාණයපුරාවිද්‍යා* පශ්චාත් උපාධි ආයතනයඃ කැළණිය විශ්වවිද්‍යාලය.

මුණසිංහ ඉන්ද්‍රානි, (1997)*ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය.* කතෘ ප්‍රකාශන.

යටවර, .එම්.ඩී.එස් (2000)*බෙලිගල් කෝරළය සහ එහා ජාත්‍යන්තර සබදතා.*ආරිය ප්‍රකාශන.

දිසානායක, රෝහත. (2009)*අම්බලම හා සමාජය.*ආරිය ප්‍රකාශන.